**ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය - 2020**

-----------------------------------------------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමග සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01හි, 48 වගන්තිය ප්‍රකාරව වත්කම් හා වගකීම් හිලව් නොකල යුතු වුවද, රු.591,709 ක බැංකු අයිරා ශේෂය අතැති මුදල් ශේෂයට හිලව් කර දක්වා තිබූ අතර අයිරා ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි. 53 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කල යුතු වුවද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය සඳහා සන්සන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල මුදල් හා බැංකු ශේෂයන්හි සාරාංශයක් පමණක් දක්වා ඇති අතර මුදල් හා බැංකු ශේෂයන්හි විස්තරාත්මක වාර්තාව සටහන් අංක 06 යටතේ දක්වා ඇත. එහි අදාල ජංගම ගිණුමේ ශේෂය රු.591,709ක අයිරා ශේෂයක් ලෙස දක්වා ඇත.<br>ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි දක්වා ඇති ආකෘතිය අනුව පිලියෙල කර ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | මධ්‍යස්ථානය විසින් 1998 වර්ෂයේ ජේ.ආර්.ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය නැමැති | පාලක මණ්ඩල අනුමැතිය සහිතව එවකට පාලක මණ්ඩල සාමාජිකයෙකුගේ සභාපතිත්වයෙන් | ආයෝජන ශේෂය අලාභයක් |

| | | | |
|---|---|---|---|
| | අනුබද්ධිත පෞද්ගලික සමාගමක රු.5,000,000ක් ආයෝජනය කර තිබූ අතර එම සමාගම 2008 වර්ෂයේදී වසා දැමීම හේතුවෙන් ආයෝජනයෙන් රු.700,000ක් පමණක් ආපසු ලැබී තිබුණි. ආයතනය වසා දමා වසර 12 ක කාලයක් ගතවී ඇතත් උපලබ්ධි කරගත නොහැකි වූ ඉතිරි රු.4,300,000 ක ආයෝජන ශේෂය අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනයන්හි දිගු කාලීන ආයෝජනයක් ලෙස දක්වා තිබුණි. උපලබ්ධි නොවන මෙම ආයෝජන ශේෂය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | යුතුව ආරම්භ කරන ලද ජේ.ආර්.ජයවර්ධන තොරතුරු මධ්‍යස්ථානය 2008 වසරේ දී බුන්වත්වීම නිසා වසා දමා ඇත. මේ නිසා අදාල ආයතනයෙන් මෙම මුදල හෝ ඒ සඳහා හිමිවිය යුතු ලාභාංශ ලබා ගැනීමේ හැකියාවක් නොමැති හෙයින් මූල්‍යය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුලත් රු.4,300,000ක මුදල ඉවත් කිරීම සඳහා 2015 දෙසැම්බර් 15 දින පැවති පාලක මණ්ඩල රැස්වීමේ දී පාලක මණ්ඩල අනුමැතිය ලැබුනි. අදාල ආයෝජන මුදල ගිණුම්වලින් ඉවත් කිරීමට මහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කරනු ලැබූ අතර මහ භාණ්ඩාගාරය විසින් බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තුමාගේ නිර්දේශ සඳහා යොමු කර තිබේ. | ලෙස ගිණුම්වලට ගැලපීම සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් කල යුතුය. අලාභය වගකිව යුතු පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි, 08 වන වගන්තිය ප්‍රකාරව මධ්‍යස්ථාන කෞතුකාගාරයේ ඇති පෞරාණික වටිනාකමකින් යුත් ප්‍රවේණිගත වත්කම් පිළිබඳ හෙළිදරව් කර නොතිබුණි. 21 වගන්තියට පටහැනිව රු.481,346ක් වූ අලුත්වැඩියා හා නඩත්තු වියදම් ප්‍රාග්ධනගත කර තිබූ අතර මේ හේතුවෙන් වර්ෂයේ ලාභය හා ස්ථාවර වත්කම්වල ධාරන අගය රු.430,412 කින්ද, 2020 දෙසැම්බර් 31 දිනට ක්ෂය වෙන්කිරීම රු.50,934කින්ද වැඩියෙන් දක්වා තිබුණි. එසේම 50 වගන්තිය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන වෙනම ගිණුම්ගත නොකර ඉඩම් ද ඇතුලත් ගොඩනැගිලි වෙනුවෙන් සියයට 5 ක එනම් රු.1,731,644ක ක්ෂය වෙන් කිරීම් කර තිබුණි. | ප්‍රවේණිගත වත්කම් සම්බන්ධයෙන් කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබාගැනීමට කටයුතු කරන ලදි. අලුත්වැඩියා හා නඩත්තු වියදම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 14 වන ඡේදයෙහි සඳහන් හඳුනා ගැනීමේ මූලධර්මය අනුව දේපල පිරියත හා උපකරණ අයිතමයක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන ලද වියදම් වන අතර එම නිසා අදාල පිරිවැය දරන අවස්ථාවේදී හඳුනා ගැනීමේ නිර්නායකයන් තෘප්ත කරනු ලැබූ නිසා අදාල වියදම ප්‍රාග්ධන වියදම් ලෙස සටහන් කරන ලදී.<br>මධ්‍යස්ථානය ආරම්භයේ සිටම ඉඩම් හා ගොඩනැගිලි වෙන වෙනම තක්සේරු කර නොතිබුනි. තක්සේරු දෙපාර්තමේන්තුව මගින් 2015 වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම වෙන් වෙන්ව තක්සේරු කර ගනු ලැබූ අතර එකී වාර්තාව ලබාගෙන 2021 වර්ෂයේ සිට ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන්ව සටහන් කිරීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව ප්‍රවේණිගත වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීම්, වියදම් හා වත්කම් ගිණුම්ගත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව පිරිවැය රු.20,120,653 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන වත්කම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. | 2020 වර්ෂය තුලදී දේපල පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම සඳහා සැලැසුම් කරනු ලැබුවත් කෝවිඩ් 19 ව්‍යාප්තිය හේතුවෙන් 2020 වර්ෂයේ වැඩි කාලයක් සංචරණ සීමා පනවා තිබූ නිසා ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට නොහැකි වී ඇත. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09හි, 15 වගන්තිය ප්‍රකාරව තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට මැනිය යුතු වුවද රු.4,280,329ක් වූ විකිණීමට තබා ඇති පොත් තොගය විකුණුම් මිලට දක්වා තිබීමෙන් ඌණතාවය වැඩියෙන් දැක්වුනු අතර 47(අ) වගන්තිය ප්‍රකාර අවශ්‍ය හෙළිදරව් කිරීම් කර ද නොතිබුණි. රු.657,775ක විකුණුම් මිලට දක්වා තිබූ හානි වූ පොත් 1914 ක් 38සිට 42දක්වා වූ වගන්ති ප්‍රකාරව ශුද්ධ උපලබ්ධි අගයට මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීම් කර නොතිබුණි. | ඉදිරියේ දී පොත් තොග වටිනාකම පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගය පදනම් කර ගනිමින් ගණනය කිරීමට තීරණය කරන ලදි. හානි වූ පොත් වටිනාකම තක්සේරු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 38 සිට 42 ඡේද ප්‍රකාරව මූල්‍යය ප්‍රකාශන තුල ගැලපීම් කිරීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිත 15 හි 14 වගන්තිය ප්‍රකාරව අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් හා එම වටිනාකම් අතර වන ප්‍රමාණාත්මක වෙනස්කම් සඳහා හේතු පැහැදිලි කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට අයවැය ලේඛනයේ වටිනාකම් හා සත්‍යය වටිනාකම් අතර සැසදීමක් මූල්‍යය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |
| (උ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, සේවක අර්ථ සාධක අරමුදල්, සේවානියුක්තයන්ගේ භාර අරමුදල් හා පාරිතෝෂික දායකත්වයන් අදාල වන පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම සම්බන්ධයෙන් සිදුකල යුතු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. ජංගම වගකීම් හා ජංගම නොවන | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හි 19 ඡේදය ප්‍රකාරව සේවක ප්‍රතිලාභ යටතේ මධ්‍යස්ථානය පාරිතෝෂික දීමනා ගෙවනු ලබන අතර ඒ සම්බන්ධයෙන් වාර්තා කර ඇත. පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම වැරදීමකින් ජංගම වගකීම් යටතේ දක්වා ඇති අතර ඉදිරියේ දී නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතයේ නියමයන්ට අනුව සිදුකල යුතු හෙළිදරව් කිරීම් කිරීමට හා පාරිතෝෂික නිවැරදි ආකාරයට ගිණුම්වල දැක්වීමට |

| | | | |
|---|---|---|---|
| | වගකීම් ලෙස වෙන් කර දැක්විය යුතු රු.4,952,653ක් වූ 2020 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂික වෙන් කිරීම් ජංගම වගකීමක් ලෙස දක්වා තිබුණි. | | කටයුතු කල යුතුයි. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුහුණත වටිනාකම රු.4,484,303 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල වසරක කාලයක් සඳහා රු.4,202,720 ක් ආයෝජනය කර තිබුණු අතර අදාල ආයෝජන වටිනාකම රු.281,583 ක් අඩුවෙන්ද, රු.33,567,187ක් වූ ස්ථාවර තැන්පතුවක අගය රු.37,118,596ක් ලෙස රු.3,551,408ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. භාණ්ඩාගාර බිල්පත් වලට අදාල සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම හා කලින් ලද පොලී ආදායම පිළිවෙලින් රු.189,527 ක් හා රු.92,056 ක් වූ අතර එය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | කෙටිකාලීන ආයෝජන තුල භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත වටිනාකම වන රු.4,484,303 ඇතුලත් කොට නොමැති අතර එහි සත්‍යය වටිනාකම රු.4,202,720 ඇතුලත් කොට ඇත.<br>ස්ථාවර තැන්පතුවල ශේෂය විගණනය වෙත සනාථ කිරීමේ ලේඛන සෘජුවම ලබා දෙන ලෙස බැංකු වෙත ලිඛිතව දන්වා ඇත.<br>2020 වර්ෂයේ පොලි ආදායම් ගිණුමේ භාණ්ඩාගාර බිල්පත්වල පොලිය ලෙස රු.281,583ක් සඳහන් කර ඇති අතර 2020වර්ෂයට අදාල පොලි ආදායම රු.189,527ක් කලින් ලද ආදායම සමග පොලි ආදායම් ගිණුමට බැර කර ඇත. ඉදිරියේ දී පොලි ආදායම සහ කලින් ලද පොලි ආදායම වෙන් වෙන්ව සටහන් කිරීමට සටහන් කර ගන්නා ලදි. | නිවැරදි වටිනාකම් නිවැරදි ආකාරයට ගිණුම්වල දැක්වීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, වර්ෂය තුල දේපළ පිරියත හා උපකරණ මිලදී ගැනීම් වටිනාකම රු.201,500ක් අඩුවෙන් දක්වා තිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ මුදල් ප්‍රවාහය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත මුදල් ප්‍රවාහය තුල වර්ෂයට අදාල ක්ෂය වියදම රු.201,500ක් අඩුවෙන් හා රු.11,532ක සුළු මුදල් ශේෂය ජංගම වත්කම්වල වැඩිවීමක් වශයෙන් ඇතුලත් කිරීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වූ මුදල් ප්‍රවාහය රු.189,968 කින් වැඩියෙන් දක්වා තිබුණි. | මූල්‍ය නොවන වත්කම්හි වෙනස් වීම පමණක් සටහන් කල යුතු නිසා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල සටහන් කර තිබෙනුයේ වර්ෂයේ ශුද්ධ ක්ෂය ප්‍රමාණයයි. එනම් 2020 වර්ෂයේ ක්ෂය රු.4,376,019න් 2020 වර්ෂය තුලදී සමුච්චිත ක්ෂය ප්‍රමාණයෙන් ඉවත් කරන ලද රු.201,500ක වටිනාකම අඩු කිරීමෙනි.<br>මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ජංගම වත්කම් වැඩි වීම යටතේ දක්වා තිබෙනුයේ ජංගම වත්කමක් වන සුළු මුදල්හි වර්ෂය තුලදී සිදු වූ විචලනයයි. එය 2021/12/31 දිනට වූ සුළු මුදල් ශේෂය නොවන බව කාරුණිකව දන්වමි. | නිවැරදි වටිනාකම් නිවැරදි ආකාරයට ගිණුම්වල දැක්වීමට කටයුතු කල යුතුයි. |

### 1.5.4 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ආයෝජනය කර තිබූ රු.26,625,494ක් වූ මාස 12ක ස්ථාවර තැන්පතුවක පොළී මුදල සෑම වර්ෂයකදීම මුල් මුදලට එකතු කර නැවත ආයෝජනය කිරීමට මධ්‍යස්ථානය එකඟතාවය ලබාදී තිබියදී, 2020 අප්‍රේල් 01 දක්වා වසරක කාලයක් සඳහා පොළී මුදල වූ රු2,928,804ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව ආපසු ලබාගෙන තිබුණි. | ආයතනයේ ආදායම පහත වැටීම නිසා 2020 වර්ෂයේ පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් මුදල් නොමැති වූ නිසා ස්ථාවර තැන්පතු පොලී මුදල ලබා ගත් අතර ඉදිරියේ දී පැවැත්වීමට යොජිත පාලක මණ්ඩල රැස්වීමේ දී මේ සඳහා අවශ්‍ය ආවරන අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය. | පාලක මණ්ඩල අනුමැතිය මත ආයෝජන ආපසු ලබා ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ආ) | පිරිවැය රු.201,500 ක් වූ ස්ථාවර වත්කම් පොත්වලින් ඉවත් කිරීම සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ සහ පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේ දී ස්ථාවර වත්කම් පොත් වලින් ඉවත් කිරිමේ දී භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සිදු කිරීමට සටහන් කර ගන්නා ලදි. | පාලක මණ්ඩල අනුමැතිය මත ස්ථාවර වත්කම් ඉවත් කිරීමට කටයුතු කල යුතුයි. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.117,839,906 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් පංති 17කට අදාළ විස්තරාත්මක උපලේඛන හා වසර 20 ඉක්මවූ රු.82,500 ක් වූ ආපසු ලබාගත හැකි තැන්පතු මුදල සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර නොමැති නිසා විගණනය විසින් සඳහන් කරනු ලබන ස්ථාවර වත්කම්වල පිරිවැය සඳහා විස්තරාත්මක ලේඛන ඉදිරිපත් කිරිමට නොහැකි විය. තැන්පත් මුදල සම්බන්ධයෙන් අනුසාංගික තොරතුරු සොයා ගැනීමට නොහැකි වි ඇත. ඒ සඳහා අදාල තොරතුරු විමර්ශනය කර අවශ්‍යය ගැලපීම් කිරීමට සටහන් කර ගන්නා ලදි. | විගණනයට අවශ්‍ය තොරතුරු, ලේඛන හා උපලේඛන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිලි කුලී ආදායම නිසි පරිදි මාසිකව අයකරගැනීමට ක්‍රමවේදයක් හා සක්‍රීය උත්සාහයක් ගෙන නොමැතිවීම හේතුවෙන් 2020 වර්ෂයට අදාල ගොඩනැගිලි කුලී ආදායම රු.17,737,363ක් වුවත් ඉන් කුලී ගැණුම්කරුවන් 8 දෙනෙකුට අදාලව ලැබිය යුතු රු.4,247,259ක් අයවී නොතිබුණි. 2013 - 2019 කාල පරිච්ඡේදයට අදාලව ලැබිය යුතු කුලී ආදායම රු.5,664,347 ක් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබූ අතර ඒ තුල මේ වන විට කුලී පදනමෙන් ඉවත්වූ ආයතන 05ක් වෙතින් අයවිය යුතු රු.4,093,380ක් ද විය. | 2020 වර්ෂයට අදාල ලැබිය යුතු ගොඩනැගිලි කුලී මේ වන විට ලැබී ඇත. 2013 සිට 2019 සඳහා අදාල කුලී මුදල් අය කර ගැනීම සඳහා දැනුවත් කර ඇත. තව දුරටත් මුදල් ගෙවීම පැහැර හරින්නේ නම් 2022 වර්ෂය තුලදී අදාල ආයතනවලට විරුද්ධව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරනු ලබන බව දන්වමි. 2014 වර්ෂයේ දී C.I.F.L ආයතනය බුන්වත් වීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වසා දමා ඇත. ඊට අදාලව ලැබිය යුතු රු.1,887,195ක් අයකර ගැනීමට හැකියාවක් නොමැති නිසා ඉදිරියේ දී භාණ්ඩාගාරයේ ද අනුමැතියට යටත්ව ගිණුම් තුලින් ලියා හැරීමට සටහන් කර ගන්නා ලදි. | අදාල මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017අංක 24 දරන දේශීය ආදායම් පනතේ (1)2 හා 102 වගන්ති | මධ්‍යස්ථානය ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර 2018/2019 හා 2019/2020 තක්සේරු වර්ෂ සඳහා ආදායම් බදු ගෙවීමටද කටයුතු කර නොතිබුණි. | මධ්‍යස්ථානය ලාභ ලැබීමේ අරමුණින් ක්‍රියාත්මක නොවන නිසා ආරම්භයේ සිටම ආදායම් බදු ගෙවා නැත. | දේශීය ආදායම් පනතේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |
| (ආ) | 1970 අංක 16 දරන සේවක අර්ථ සාධක අරමුදල් (සංශෝධන) පනතේ 15 වගන්තිය | සේවක අර්ථ සාධක අරමුදලේ මාසික දායක මුදල් ඊළඟ මස අවසාන දිනට පෙර ගෙවිය යුතු වුවද, 2000 වර්ෂයට | කෝවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑමෙන් 2020 වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් අදායම පහත වැටීම නිසා වර්ෂයේ අවසාන | සේවක අර්ථසාධක අරමුදල් පනතේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | අදාල දායක මුදල් රු.249,119ක් සහ 2020 ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලට අදාල දායක මුදල් රු.370,747ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවා නොතිබුණි. | කාර්තුවේ වියදම් පියවීම පමා කිරීමට සිදු විය. එම නිසා 2020 වර්ෂයේ අවසාන කාර්තුවේ සේවක අර්ථසාධක අරමුදල් දායකය ගෙවීම ප්‍රමාද විය. | |
| (ඇ) 1980 අංක 46 දරන සේවානියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ 16 වගන්තිය | සේවානියුක්තයන්ගේ භාර අරමුදලේ මාසික දායක මුදල් ඊළඟ මස අවසාන දිනට පෙර ගෙවිය යුතු වුවද 2020ඔක්තෝබර් හා නොවැම්බර් මාස වලට අදාල දායක මුදල් රු.55,612ක් 2020 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවා නොතිබුණි. | කෝවිඩ් 19 වසංගත තත්ත්වයේ බලපෑමෙන් 2020 වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ආදායම පහත වැටීම නිසා වර්ෂයේ අවසාන කාර්තුවේ වියදම් පියවීම පමා කිරීමට සිදු විය. එම නිසා 2020 වර්ෂයේ අවසාන කාර්තුවේ සේවක භාරකාර අරමුදල් දායකය ගෙවීම ප්‍රමාද විය. | සේවානියුක්තයන් ගේ භාර අරමුදල් පනතේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |
| (ඈ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 හා 41 වගන්ති | මධ්‍යස්ථානය පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබූ අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | බුද්ධ ශාසන ආගමික සහ සංස්කෘතික අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි. ආයතනය සඳහා අභ්‍යන්තර විගණක සහායක තනතුරක් ඇති කර ඒ සඳහා අවශ්‍ය බඳවා ගැනීම් කටයුතු සිදු කිරීමට සටහන් කර ගන්නා ලදි.<br>ඉදිරියේ දී මධ්‍යස්ථානය සඳහා විගණන සහ කළමනාකරන කමිටුවක් ස්ථාපිත කිරීමට සටහන් කර ගන්නා ලදි. | ජාතික විගණන පනතේ නියමයන්ට අනුව කටයුතු කල යුතුයි. |
| (ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | | | |

| | | | | |
|---|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 137, 139 ,138 හා 245 | රු.1,009,707ක් වටිනා ගෙවීම් වවුචර් 12ක් අනුමැතියකින් තොරවද, රු.1,965,250ක් වටිනා ගෙවීම් වවුචර් 21ක් සහතික කිරීමකින් තොරවද, රු.694,156ක් වටිනා වවුචර් 15ක් අනුමත කිරීමෙන් හා සහතික කිරීමකින් තොරවද ගෙවා තිබුණි. | ඉදිරියේ දී මුදල් රෙගුලාසි 138, 139 හා 242 ප්‍රකාරව වවුචර් පත් ගෙවීමට සටහන් කර ගන්නා ලදි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කල යුතුයි. |
| (ii) | මුදල් රෙගුලාසි 272 | රු.56,242ක් වටිනා ගෙවීම් වවුචර 06ක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | අදාල වවුචර් පත් විගණනය වෙත යොමු කර ඇත. | මුදල් රෙගුලාසි අනුව වවුචර් පත් විගණනය වෙත ඉදිරිපත් කල යුතුයි. |
| (ඊ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාන්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | 2021 වර්ෂයේ සිට 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය සකස් කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛ නියමයන් අනුව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතුයි. |
| (උ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්ය මණ්ඩලය සහ දැනට සිටින කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර හා ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. | මධ්‍යස්ථානය විසින් 2020 වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සහ ක්‍රියාකාරී සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර ඇත. ප්‍රසම්පාදන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන සැලැස්ම 2021 වර්ෂයේ සිට විගණනය වෙත යොමු කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛ නියමයන් අනුව සැලැසුම් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඌ) | 2011 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 | අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව දිනකට | උපදේශක ගාස්තු ගෙවීම සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. ඉදිරියේ දී | චක්‍රලේඛ නියමයන් අනුව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| වගන්තිය | රු 5,000බැගින් ගෙවීමේ පදනම මත පුස්තකාල කටයුතු පිළිබඳ උපදේශකවරයෙකු පත්කර තිබුණි. මෙම පත්කිරීම දින 45 ක් නොඉක්මවිය යුතු වුවද 2014 වර්ෂයේ සිට දිගින් දිගටම උපදේශකවරයාගේ සේවය ලබා ගෙන තිබූ අතර 2020 වර්ෂයේ මසකට රු.30,000 බැගින් මාස 05ක් සඳහා රු.150,000ක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීමට සටහන් කර ගන්නා ලදි. පුස්තකාල සහ පුරාවිද්‍යාව පිළිබඳ ප්‍රකට මහාචාර්යවරයෙකු වන කේ.ඩී.පරණවිතාන මහතාගේ සේවය මධ්‍යස්ථානයේ පුස්තකාලය සහ කෞතුකාගාරයේ ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගැනීම වෙනුවෙන් එතුමාගේ සේවය දීර්ඝ කාලීන ලෙස ලබා ගන්නා ලදි. | |
| (එ) 2003 ජුනි 02දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| 5.2.1 වගන්තිය | 2020 අයවැය ඇස්තමේන්තුව සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, අයවැයගත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි. | 2019 සැප්තැම්බර් 01 සිට 2021 පෙබරවාරි 28 කාලය තුල පාලක මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට නොහැකි වූ නිසා 2020 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට නොහැකි විය. ඉදිරියේ දී පාලක මණ්ඩලයේ ද අනුමැතිය සහිතව 2003 ජුනි 02 දිනැති PED/12 දරන චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ලේඛනය විගණනය වෙත ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛ නියමයන් අනුව කටයුතු කල යුතුයි. |
| 4.2.6 වගන්තිය | කාර්තුමය, අර්ධ වාර්ෂික හා වාර්ෂික කාර්යසාධන වාර්තා පිළියෙල කර රේඛීය | 2020 වර්ෂය සඳහා කාර්තුමය අර්ධ වාර්ෂික සහ වාර්ෂික කාර්යසාධන වාර්තා | චක්‍රලේඛ නියමයන් අනුව කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර ඉදිරියේ දී අදාල වාර්තා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට යොමු කිරීමට සටහන් කර ගන්නා ලදි. | |
| | 6.5.1 වගන්තිය | මූල්‍ය වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ 2021 අප්‍රේල් 08 දින වන අතර මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසයන්හිදී කොවිඩ් 19 වෛරස ව්‍යාප්තිය නිසා රටතුල පනවා තිබූ සංචරන සහ නිරෝදායන ඇදිරි නීතිය නිසා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට ප්‍රමාද වූ නිසා නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත යොමු කිරීමට අපහසු විය. ඉදිරියේ දී නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛ නියමයන් අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුයි. |
| (ඒ) | 2019 දෙසැම්බර් 09 දිනැති අංක PED03/2019 සහ 2020 දෙසැම්බර් 18 දිනැති අංක PED/03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 දරන රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධිවිධානයන් පිළිපැද නොතිබියදී 2019 හා 2020 වර්ෂවල ප්‍රසාද දීමනා ලෙස රු.781,750ක් අවස්ථා 2කදී ගෙවා තිබූ අතර ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම ප්‍රසාද දීමනා ගෙවීම කරනු ලැබුයේ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක PED/03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරවය. ඉදිරියේ දී ප්‍රසාද දීමනා ගෙවීමේ දී 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 රාජ්‍ය ව්‍යාපාරයන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5 ඡේදයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛ නියමයන් අනුව ප්‍රසාද දීමනා ගෙවීමට කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඔ) | 2020 ජුනි 10 දිනැති අංක 07/2020(III) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියක් රහිතව 2020 ජුනි, ජුලි හා දෙසැම්බර් මාස වලදි ආපදා ණය වාරික අයකරගෙන නොතිබුණි. මේ හේතුවෙන් අයකර ගත යුතු ආපදා ණය වාරික මුදල් රු.141,852ක් අඩුවෙන් අයකර ගෙන තිබුණි. | රට තුල පැවති කෝවිඩ් 19 වසංගත තත්ත්වය මත සේවකයින්ට ආර්ථිකමය සහනයක් සැලැසීම වෙනුවෙන් ලබා දී ඇති ණය වෙනුවෙන් 2020 වර්ෂයේ ජුනි, ජුලි සහ දෙසැම්බර් මාසයන්හි දී වාරික මුදල් අඩු කර නොගත් අතර ඉදිරියේ දී ණය වාරික මුදල් අය කර ගැනීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ විධිවිධාන අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි. | චක්‍රලේඛ නියමයන් අනුව කටයුතු කල යුතුයි. |
| (ඕ) | 2015 මාර්තු 26දිනැති 07/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | (i) උත්සව අත්තිකාරම් ලෙස රු.10,000ක් වෙනුවට සේවකයන් 19 දෙනෙකුට රු.30,000 බැගින් රු.570,000ක මුදලක් ලබාදී තිබුණි. | 2016, 2017, 2018, 2019 සහ 2020 යන වර්ෂයන්හී දී උත්සව අත්තිකාරම් ලෙස එක් සේවකයෙකුට රු.30,000 බැගින් ලබා දුන් අතර ඉදිරියේ දී 2015 මාර්තු 26 දිනැති අංක 07/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව උත්සව අත්තිකාරම් ගෙවීමට සටහන් කර ගන්නා ලදි. එමෙන්ම මධ්‍යස්ථානය විසින් වාර්ෂිකව පුනරාවර්තන වියදම් හෝ ප්‍රාග්ධන වියදම් සඳහා භාන්ඩාගාර මුදල් ලබා නොගන්නා බැවින් උත්සව අත්තිකාරම් ගෙවීම සඳහා භාන්ඩාගාරයේ අනුමැතිය ලබා නොගන්නා ලදි. | චක්‍රලේඛ නියමයන් අනුව කටයුතු කල යුතුයි. |
| | | (ii) උත්සව අත්තිකාරම් සමාන වාරික 08 කින් අයකළ යුතු වුවද, රු.3,000 | කොවිඩ් 19 වසංගත තත්ත්වය මත සේවකයින්ට ආර්ථිකමය සහනයක් සැලැසීම වෙනුවෙන් ලබා දී ඇති | චක්‍රලේඛ නියමයන් අනුව කටයුතු කල යුතුයි |

| | | | |
|---|---|---|---|
| | | බැගින් වූ වාරික 10 කින් එම අත්තිකාරම් අයකර ගෙන තිබූ අතර මේ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රු.226,818ක අයකර නොගත් ශේෂයක් පැවතුණි. | ණය වෙනුවෙන් 2020 වර්ෂයේ ජුනි, ජූලි සහ දෙසැම්බර් මාසයන්හි දී වාරික මුදල් අඩු නොකල අතර ඉදිරියේ දී ණය වාරික මුදල් අය කර ගැනීමේ දී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ විධිවිධාන අනුව කටයුතු කිරීමට සටහන් කර ගන්නා ලදි.<br>2020 වර්ෂයට අදාල වාරික මුදල් මේ වනවිට ගෙවා අවසන් කර ඇති අතර ඉතිරි මුදල් අයකර ගැනීමට දැනට ආයතනයෙන් ඉවත්ව සිටින සේවකයින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,007,114 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.9,110,636ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,117,750 පිරිහීමක් නිරීක්ෂණය විය. වර්ෂයේ වැටුප් හා වේතන වියදම රු.1,982,244 කින් අඩු වුවද, ගොඩනැගිලි කුලී ආදායමද රු.15,963,206 කින් අඩු වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-------------------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2002 වර්ෂයේදී පෞද්ගලික බැංකුවක රු.9,725,000 ක මුදලක් ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර තිබුණු අතර එම බැංකුව බුන්වත් වීම හේතුවෙන් මහ බැංකුව විසින් තැන්පත්කරුවන්ගේ වගකීම ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව හරහා පියවීමේ යෝජනා ක්‍රමයක් සකසා තිබුණි. ඒ අනුව අදාල මුදල් සියයට 5ක වාර්ෂික පොලියක් මත, 2017 වසරේ | මධ්‍යස්ථානය විසින් 2002 වර්ෂයේ දී රු.9,725,000 ක මුදල ශ්‍රී ලංකා ප්‍රමුඛ බැංකුවේ ආයෝජනය කර තිබූ අතර බැංකුව බංකොලොත් වීම නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝග ප්‍රකාරව 2007 වර්ෂයේ දෙසැම්බර් 03 වන දින සිට වසර 10 කට ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවේ ණයකර තුල ආයෝජනය කරන ලදි. ආයෝජනය කරන ලද අවස්ථාවේ දී 2007 – 2008 වසර සඳහා අදාල ණයකර පොලිය නොගෙවන බවට බැංකුව විසින් සඳහන් කර ඇති අතර ඉතිරි වර්ෂ 09 සඳහා අදාල පොලී ආදායම ලබා දී | කල් පිරී ඇති ණයකර හා වසර 09 ක පොලී ආපසු ලබාගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ආපසු ලබාගත හැකි පරිදි ණයකර ලෙස තැන්පත්කර තිබුණද පළමු වසර 02ක කාලයක් සඳහා අදාල බැංකුව එකඟ වූ පරිදි පොළී නොගෙවීම හේතුවෙන් මධ්‍යස්ථානයට රු.972,500ක පොළී මුදලක් අහිමි වී තිබුණි. 2017 දෙසැම්බර් 03 දින මෙම ණයකර කල් පිරී තිබුණද මුල් මුදල හා වසර 09 ක පොළී මුදල වූ රු.14,101,250 ආපසු ලබාගැනීමට මධ්‍යස්ථානය කටයුතු කර නොතිබූ අතර ණයකර තැන්පතු වලට අදාල සෘජු ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | තිබේ. මෙම මුදල් ආපසු ලබා ගැනීම සඳහා පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද පාලක මණ්ඩල පත්‍රිකාවක් සහ අදාල පාලක මණ්ඩල රැස්වීමේ වාර්තාව ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුවට ලබා දිය යුතු අතර 2017/12/03 දින සිට පාලක මණ්ඩල රැස්වීමක් සංවිධානය කර ගැනීමට නොහැකි වූ නිසා මෙම ආයෝජන මුදල සහ පොළී මුදල ආපසු ලබාගෙන නැවත ආයෝජනය කිරීමට නොහැකි වී තිබේ. ඉදිරියේ දී පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මුදල් ආපසු ලබා ගෙන නැවත ආයොජනය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට සටහන් කර ගන්නා ලදි. | |
| (ආ) | මධ්‍යස්ථානය විසින් බාහිර පාර්ශව වෙතින් රැස්කර ගන්නා ලද මුද්දර ගාස්තු රු.7,175 ක් හා ජාතිය ගොඩනැගීමේ බදු රු.184,589 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකර සහ එකතු කල අගය මත බදු රු.1,955,488 ක් අදාල පාර්ශව වෙත ආපසු නොගෙවා මාස 6 සිට වසර 2 දක්වා කාලයක් රඳවා තබාගෙන තිබුණි. | ජාතික ගොඩනැගීමේ බදු සහ එකතුකල අගය මත බදු මුදල් ගණුදෙනු කරුවන්ගෙන් අය කර ගත් පසු එම මුදල් දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට පෙර දේශිය ආදායම් දෙපාර්තමේන්තුව එකතු කල අගය මත බද්දෙන් ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය නිදහස් කර ඇත. මෙම බදු මුදල් සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමට සටහන් කර ගන්නා ලදි. | අදාල බදු අදාල පාර්ශව වෙත ගෙවීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | ගොඩනැගිලි කුලියට ලබාදීමේදී ආයතන 6ක් සමග කුලී ගිවිසුම් වලට එළඹ නොතිබූ අතර ආයතන 3ක් සමග එළඹි ගිවිසුම් ලියාපදිංචිකර නොතිබුණි. මෙම පරිශ්‍රවල කුලී තක්සේරු වාර්තා ලබාගෙන මිල ගණන් සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර වර්ග අඩියක් රු.115 සිට රු.165 ක් වූ වැනි ඉතා අඩු මිල ගණන් යටතේ කුලියට ලබා දී තිබුණි. | ආයතන 6ක් සමග කුලී ගිවිසුම් ගත වී තිබේ. ආයතන 3ක් සමග 2021වර්ෂයේ සිට ගිවිසුම් ගත වීමට අපේක්ෂිතය. මධ්‍යස්ථානයේ ගොඩනැගිලි පරිශ්‍ර සඳහා වාර්ෂිකව විශාල ඉල්ලුමක් නොපවතී. ගොඩනැගිලි කුලියට ලබා ගනු ලබන ආයතන විසින් දිර්ඝ කාලීනව රැදීසිටීමේ හැකියාව සලකා බැලීම සහ රජයේ අමාත්‍යාංශ යටතේ පවතින ව්‍යාපෘති අවසන් වන තුරු රැදී සිටීමේ පදනම මත ගොඩනැගිලි කුලීයට ලබා ගනු ලබන නිසා වාර්ෂිකව ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම ප්‍රායෝගිකව අපහසු බව කාරුණිකව දන්වමි. | ගොඩනැගිලි වල වර්තමාන වෙළඳ වටිනාකම මත කුලියට ලබාදීමට හා ගිවිසුම් ලියාපදිංචි කිරීමට කටයුතු කල යුතුයි. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානයේ සිවිලිම අලුත්වැඩියා කිරීමේ රු.1,189,050ක කොන්ත්‍රාත්තුවට අදාල පළමු අතුරු ගෙවීම වශයෙන් 2020 අගෝස්තු 10 දින ඉදිරිපත් කල රු.382,960 ක ඉන්වොයිස්පත මගින් ආවරණය වී තිබුණේ වැඩබිමේ පැවති ද්‍රව්‍ය තොග පමණක් වූ අතර අදාල ද්‍රව්‍ය තොගවල නිරවද්‍යතාවය ඉංජිනේරුවරයෙකු විසින් සහතික කර නොතිබුණි. මීට අමතරව කොන්ත්‍රාත්කරුගේ ගිණුමට සෘජුව රු.689,639ක් මාරු කර තිබුනු අතර රු.344,975ක ගෙවීමට අදාළ කිසිදු ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | මධ්‍යස්ථානයේ සිවිලිම අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මූලික ගෙවීම වශයෙන් රු.382,960 ගෙවීම් කරනු ලැබුවේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 5.4.4 ඡේදය ප්‍රකාරව 30% අත්තිකාරම් මුදලක් ගෙවීමේ හැකියාව ප්‍රකාරවය. මෙම ගෙවීම සිදු කරන අවස්ථාව වන විට මෙම ප්‍රසම්පාදනයේ 20% ක භෞතික ප්‍රගතියක් ද සිදු වී තිබින. 2020 ඔක්තෝම්බර් මස 16 දින වන විට කෝවිඩ් 19 වසංගත ව්‍යාප්තිය නිසා රටතුල සංචරන සීමා දැඩිව පනවා තිබූ අතර චෙක්පත් අත්සන් කිරීමට සේවයට පැමිණීමට නොහැකි වූ නිසා මෙම ගෙවීම බැංකු ගිණුම් හරහා සිදු කරන ලදි. මේ සම්බන්ධයෙන් අදාල තොරතුරු ප්‍රසම්පාදන ලිපි ගොනුවට අමුණා ඇත | ඉංජිනේරුවර යෙකුගේ සහතික මත ගෙවීමට කටයුතු කල යුතුයි. මුදල් රෙගුලාසි අනුව ගෙවීම් කල යුතුයි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 36ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 22ක් වු අතර තනතුරු 08ක පුරප්පාඩු 14ක් විය. අනුමත කාර්ය මණ්ඩලය මධ්‍යස්ථානයේ කාර්යභාරයට ගැලපෙන පරිදි සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබූ අතර කාර්යභාරයට නොගැලපෙන සුපවේදී තනතුරු 02ක්ද පැවතුනි. කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 05 දෙනෙකු බඳවාගෙන තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අනුමත කාර්ය මණ්ඩලය ආයතනයේ වර්තමාන කටයුතු සහ ක්‍රියාකාරීත්වයට ගැලපෙන පරිදි සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සටහන් කර ගන්නා ලදි.<br>කලමණාකරන සහකාර තනතුරු 2 සඳහා බඳවා ගනු ලැබූ සේවකයින් දෙදෙනා මේ වන විට ස්ථිර කාර්ය මණ්ඩලයට ඇතුලත් කර ඇති අතර රියදුරු සේවයට බඳවා ගනු ලැබූ සේවකයින් දෙදෙනා බඳවා ගනු ලබන අවස්ථාව වන විටත් ස්ථිර කිරීමට අදාල වයස් මට්ටම ඉක්මවා සිටි නිසා ස්ථිර කිරීමට නොහැකි වී ඇත. | අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරගැනීමට හා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන බඳවා ගැනීමට කටයුතු කටයුතු කල යුතුයි. |